# සංගීත භාණ්ඩ 100 ක් වාදනය කරමින් ගිනස් වාර්තාවකට



වාදකයෙකු ලෙස ගිටාරය කේන්ද්‍ර කරගත් නාලක සජී ජයසිංහ වන ඔහු විවිධ රට වල විවිධ සංගීත සම්ප්‍රදායන්ට අදාල විශාල සංගීත භාණ්ඩ ප්‍රමාණයක් වාදනය කරන අද පරපුරේ සංගීතඥයෙකි.

ප්‍රවීණ නර්තන ශිල්පියෙකු ලෙස අපේ සංස්කෘතිය අපේ නර්ථන කලාව ලෝකය පුරාවට රැගෙන ගිය දිනේශ් පෙරෙරා සමගින් ඔහු සැරසෙන්නේ සංගීත භාණ්ඩ 100ක් වාදනය කර ලෝක වාර්තාවක් පිහුටුවන්නටය.

පසුගිය 21 වෙනි දින නාලක සහ දිනේශ් Sydney නුවර black town bowman ශාලාවේදී ලෝකයේ ප්‍රථම වතාවට සංගීත භාණ්ඩ 100 ක් වාදනය කරමින් ලෝක වාර්තාවකට සැරසුනහ. එම ප්‍රසංගය ඉතා සාර්ථක අයුරින් නිම වුන අතර බහුතරයක් ප්‍රේක්ෂක ඉල්ලීම මත නැවතත් එම ප්‍රසංගය ඔස්ට්‍රේලියාව පුරා රැගෙන යාමට කටයුතු සුදානම් කරමින් පවතී.

1984 වසරේදී සංගීත වේදී රෝහණ වීරසිංහයන්ගේ ආයතනයෙන් ප්‍රථමයෙන්ම සංගීත අත් පොත තැබූ නාලක එම ආයතනයේම නර්තනය ආචාර්ය වූ එඩ්වර්ඩ් පෙරේරා ගුරු පියාණන් යටතේ නර්තනය හැදෑරීය. පසුව 1988 ප්‍රවීණ නර්තන ශිල්පියෙකු ලෙස ශ්‍රී ලාංකීය නර්තන කලාව ලෝකය පුරාවට ගෙනයන්නට සමත් විය. 2000 වසරේදී ඔස්ට්‍රේලියාවේ පදිංචි වීමට පැමිණි ඔහු බහු සංස්කෘතික රටක වෙසෙන ශ්‍රී ලාංකීය අපේ දූ දරුවන්ට අපේ සංස්කෘතිය බෙදා දීමට සංක රිද්ම නර්තන පාසල ලියා පදිංචි කළේය. නාලක හා දිනේෂ් අද එම ආයතනයේ අධ්‍යාපනය ලබන ශ්‍රී ලාංකික දූ දරුවන්ට සංස්කෘතික නර්තනය සහ බෙරවාදනය දායාද කරදීමට ලෝකයේ ඇති බොහාමයක් අවනද්ද බාන්ඩ වාදනය කරන වාදන ශිල්පීන් හැටියට පෙරමුණේ සිටීති.



නාලක සජී කුඩා කල සිටම සංගීතය විෂයක් ලෙස හදාරා ඇත. ඔහුගේ පළමු සංගීත භාණ්ඩය වුයේ බටනලාවයි. කුඩා කලම බටනලාව , වයලීනය හැදෑරූ ඔහු පෙර දිග , අපර දිග සියලූ සම්ප්‍රදායන් පිළිබඳ හොඳ අධ්‍යාපනයක් ලබා ඇත. තවද මේ වන විට වැඩි දුර අධ්‍යාපනය සඳහා ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ඇතුලූ වූ අතර එහිදී සිතාරය ඔහුගේ ප්‍රධාන සංගීත බාන්ඩය බවට පත්විය.

දැනට ශ්‍රී ලංකාවේ නැතුවම බැරි ප්‍රධාන පෙලේ ගිටාර් වාදකයෙකු වන ඔහු දැනට ලංකාවේ ටෙලි නාට්‍ය අධ්‍යක්ෂක වරයෙකු ලෙසද කටයුතු කරයි.ලංකාවේ ගිටාර් ඇකඩමියක් හරහා නව පරපුරට අධ්‍යාපනයක් ලබාදෙන ඔහු සංගීත උපාධිධාරී ගුරුවරයෙකි. මේ වන විට ගායකයකු ලෙසද ගීත 3 ක් නිර්මාණය කර ඇත.නදීක ගුරුගේ , මහින්ද බණ්ඩාර , සමන්ත ගී කියනගේ සංගීතවත් කල ගීත මේ අතර වේ.

මෙම ප්‍රසංගය අතිසාර්ථක කරගැනීමට උදවූ කල සහ නැරඹීමට පැමිණි සියලූ දෙනාටම නාලක සජී සහ දිනේෂ් පෙරේරාගේ ස්තුතිය හිමිවෙයි.

# ඩී බී කුරුප්පු වියතාණන්ට සෙනෙහසින් ලියමි



ඡායා රූ - ශ්‍රී ඩී පෙරේරා







උදය ගෝවින්න

2016 සැප්තරම්බර් 25 වන දා සවස 2.30 සිට 7.30 දක්වා වික්ටෝරියා ප්‍රාන්තයේ ග්ලැඩ්ස් ටන්පාක් නගරයේදි පැවති ඩී බී කුරුප්පු මහතාගේ හත්වැනි පොත් එළි දැක්වීමට ජගත් ජේ එදිරිසිංහ හිතවතාගේ බලවත් පෙරැත්තය නිසාම සහභාගිවුණෙමි.

මේ මම ඩී බී කුරුප්පු මහතාගේ පොත් එළිදැක්වීමකට සහභාගි වූ පළමු අවස්ථාවයි. මින් පෙර පැවති පොත් එළිදැක්වීම් හයට සහභාගිවන්නට නොහැකිවීම ගැන දැන් ඇත්තේ විශාල කණගාටුවකි.

මෙදින මම පොත් රැසක්ම මිලට ගත්තේ කියවන්නට හිතාගෙනම නෙවෙයි. සිංහල සාහිත්‍යයේ උන්නතියට දායකවන කුරුප්පු මහතා වැනි ලේඛකයන් දිරිමත් කිරීමට දායක වීමේ චේතනාවෙනුයි.

උත්සවය අවසාන වී රෑ බෝ වී ගෙදර පැමිණි මම සිංගරු සිරිත පොත කියවන්නට ගත්තා. රාත්‍රී 12 පමණ වන විට මම පිටු පනහකට වැඩිය කියෙව්වා. පසුදින දුම්රියෙන් සේවා ස්ථානයට ගන ගමනුත් නැවත එන ගමනුත් පොත කියෙව්වා. ගෙදර ඇවිත් සම්පූර්ණයෙන්ම සිංගරු සිරිත කියවා අවසාන කළා.

1970 මුල් භාගයේ පාසල් යන දවස් වල අම්මට හොරෙන් කියවපු නවකතාවකට පස්සෙ සිංහල සාහිත්‍ය ග්‍රන්ථයක් මුලුමනින්ම කියවා අවසන් කළ පළමු අවස්ථාව මෙයයි. ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ මෙල්බන් නුවර වසර 26 කට වැඩි කාලයක් ජීවත් වන මට සමීප සහ දන්නා කියන බොහෝ කරුණු මෙම පොතෙහි අඩංගු වී තිබුණා.

ග්‍රන්ථයෙහි මුල සිට අවසානය දක්වාම කතුවරයා යොදා ගෙන තිබුණ භාෂා විලාසය නිසාම පොත එකවරම කියවා අවසන් කරන්නට මහත් ආශාවක් ඇති වුණා. සිංහල සාහිත්‍ය පොත පත නැවත කියවීම මහත් ආශාවක් ඇතිවුණා.

ලේඛකයාණනි. හිතට දැනෙන විදිහට අමතනවා නම් කුරුප්පු අංකල් ඔබට ගොඩක් පින්.

ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ ශ්‍රී ලාංකිකයන් පිලිබඳව කුරුප්පු මහතාට දැනෙන විදිහට හැඟෙන විදිහට අත්දැකීම් ගවේශනයන් තුළින් ලබා ගත් දැනුමත් කැටිකොට මෙම පොත අලංකාර වී ඇතැයි මට හිතෙනවා.

ශ්‍රී ලංකාවෙන් බැහැරව දුරු රටවල ජීවත් වන ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට රස විඳිය හැකි අන්තර්ගත කරුණු මේ පොතේ ගැබ්ව තියෙනවා. මෙල්බන් පුරවරයේ ජීවත් වන අයෙකුට නම් බොහොමත්ම සමීප කතා බව මෙහිදී මුණ ගැහෙනවා.

අප වටා ඇති සමාජය ඒ තුළ ජීවත් වන චරිත සහ ඔවුනගේ ක්‍රියාකාරකම් විනිවිද දැකිය හැකි කැඩපතක් ලෙසට සිංගරු සිරිත හඳුන්වන්නට පුලුවන්.

කෙටි පණිවිඩ 47 කින් සමන්විත මේ පොතෙහි තමා ගැන කියවෙන්නේ කොතැනකද තමන්ගේ චරිතයට ගැලපෙන කතා වස්තුව කුමක්ද තමා නිවැරදි වන්නේ කෙබඳු ආකාරයෙන්ද යනාදී ස්වයං විවරණයක යෙදෙන්නටත් මග පෑ ඉඩ කඩක් අවකාශයක් සිංගරු සිරිත විවර කර දී තිබෙනවා.

සිංගරු සිරිත ගැන මේ මා මේ සටහන තැබුවේ මට හිතුණ විදිහටයි මගේ හදට දැනුණ විදිහටයි.

පොත එළිදැක්වීම අවසානය දක්වා රැඳී සිටි මා ඩී බී කුරුප්පු වියතාණන්ට වැඳ ආචාර කොට ඔහුට නිරෝගී සුවය ප්‍රාර්ථනා කර එතැනින් නික්මුණේ ඔහුගේ මීලඟ පොත් එළිදැක්වීම මොන හේතුවක් නිසාවත් මග හැර නොගන්නා සේ මහත් වූ අධිෂ්ඨානයකිනුයි.

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com